කාර්යාලය /அலுவலகம் / Office :
දුරකථන
தொலைபேசி
Telephone
0112034347
ෆැක්ස්
பெக்ஸ்
Fax
0112887422
විද්‍යුත් තැපෑල
மின்னஞ்சல்
E-mail
agriculturemedia@gmail.com

# මාධ්‍ය ඒකකය
# ஊடகப் பிரிவு
# MEDIA UNT

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**
கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் அமைச்சு
Ministry of Agriculture, Livestock, Lands and Irrigation

මගේ අංකය
எமது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
**2025.09.08**

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ / ප්‍රවෘත්ති කර්තෘ,

## කෘෂිකර්ම,පශු සම්පත් ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කේ.ඩී ලාල්කාන්ත මහතා සහ එක්සත් ජාතීන්ගේ නේවාසික නියෝජිත Mr. Marc-André Franche අතර සාකච්ඡාවක්

**එක්සත් ජාතීන්ගේ නේවාසික නියෝජිතයන් පිරිසක් (04) කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කේ.ඩී ලාල්කාන්ත මහතා හමු විය. ඒ ගොවිජන මන්දිරයේදීය. එහිදී ඉඩම් සම්බන්ධයෙන් විශේෂ සාකච්ඡාවක් පැවැත්විණ.**

**මෙහිදී ඉඩම් සම්බන්ධයෙන් වත්මන් රජය ක්‍රියාවට නංවන හිමිකම වැඩසටහන පිළිබඳව එක්සත් ජාතීන්ගේ නේවාසික නියෝජිතයින් සිය ප්‍රසාදය පළ කළේය.**

**උරුමය වැඩසටහනේ තිබූ අඩුපාඩු මගහරවා ගනිමින් හිමිකම වැඩසටහන ක්‍රියාවට නංවන බව අමාත්‍යවරයා පැහැදිලි කළේය. උරුමය වැඩසටහන යටතේ පවුලේ කැමැත්ත පිළිබඳව විමසීමක් නොකළ අතර ඉඩම් කැබලි කිරීමේ හැකියාව ද පැවතිණි.නමුත් හිමිකම වැඩසටහන යටතේ පවුලේ කැමැත්ත විමසන අතර, ඉඩම් කැබලි කිරීමේ හැකියාවද සීමා කරමින් ඉඩම් ලබාදීමට පියවර ගත් බව මෙහිදී අමාත්‍යවරයා සඳහන් කළේය.**

**ඉඩම් සම්බන්ධ ව්‍යාපෘතිය දියත් කිරීම සඳහා අමාත්‍යවරයාගේ සහයෝගය අවශ්‍ය බව මෙහිදී එක්සත් ජාතීන්ගේ නියෝජිතයින් පෙන්වා දුන්නේය. උතුරේ අධිආරක්ෂිත කලාප සඳහා වෙන්කළ ඉඩම් සම්බන්ධයෙන් සාකච්ඡා කළ අතර, ඉඩම් බෙදා දීමේ කමිටුව සමඟ සාකච්ඡාවක් සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් දින ලබා ගැනීම ද සිදුවිය.**

මාධ්‍ය ඒකකය
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය